AL/2017/42/S-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2017 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2017

හින්දු ධර්මය I
இந்து சமயம் I
Hinduism I

42 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පසු පිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එහි **අංකය** උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි **කතිරයක්** (X) යොදා දක්වන්න.

---

- අංක **1** සිට **5** තෙක් එක් එක් ප්‍රශ්නයට අදාළ ව කරුණු පහ බැගින් දී ඇත. ඒවායින් එකක් කුමක් හෝ හේතුවක් නිසා අනෙකුත් ඒවා සමග නොගැළපේ. එම **නොගැළපෙන** කරුණ තෝරන්න.

1. (1) කාමිගම් (2) කාරණම් (3) වීරම (4) කුමාරතන්දිරම් (5) මගුඩම්

2. (1) නාසදීයසූක්තම් (2) යමසූක්තම් (3) වෛදිකසූක්තම් (4) වර්ණසූක්තම් (5) පුරුෂසූක්තම්

3. (1) ශාන්තිපර්වම් (2) බාලකාණ්ඩම් (3) තුරෝණපර්වම් (4) සුන්දර කාණ්ඩම් (5) උට්පත්ති කාණ්ඩම්

4. (1) සිවගචින්තාමනි (2) පෙරිය පුරාණම්
(3) තිරුත්තොණ්ඩර් තිරුවන්දාදි (4) කම්බරාමායණම්
(5) නාල්වර් නාන්මණිමාලෛ

5. (1) සංගරභාෂ්‍යම් (2) සිවඥානපාඩියම් (3) ශ්‍රීභාෂ්‍යම් (4) මත්තුවපාඩියම් (5) නීලකණ්ඩපාඩියම්

- අංක **6** සිට **10** තෙක් එක් එක් ප්‍රශ්නයේ පද යුගල පහ බැගින් දී ඇත. ඒවායින් එක යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම **නොගැළපෙන** පද යුගලය තෝරන්න.

6. (1) උමාපති සිවාචාරියාර් - උන්මෛ විලක්කම්
(2) මෙයිකණ්ඩ තේවර් - සිවඥානපෝදම්
(3) අරුණන්දි සිවාචාරියාර් - සිවඥාන සිත්තියාර්
(4) වාගීස මුනිවර් - ඥානාමිර්දම්
(5) තිරුක්කඩවූර් උයියවන්ද දේවර් - තිරුක්කලිට්ඃප්පාඩියාර්

7. (1) මහෙන්ද්‍රවර්මන් - තිරුචිරාප්පල්ලි ලෙන් දේවාලය
(2) මාමල්ලන් - මහිඩාසුර ශාලාව
(3) රාජසිම්මන් - කෛලාසනාථ දේවාලය
(4) නන්දිවර්මන් - මදංගේෂ්වරම්
(5) පරමේසුවර වර්මන් - මුක්තීෂ්වරම්

8. (1) වසන්දම් - ඉලවේනිල් (2) කිරීට්මම් - මුදුවේනිල්
(3) ඒමන්දම් - කුදිර්කාලම් (4) වරුෂ - මලෛකාලම්
(5) සරත් - ඉලෛ උදිර් කාලම්

9. (1) කඩයිට් සුවාමිහල් - යාපනයේ නීරාවියඩි
(2) සිත්තානෛකුට්ටි සුවාමිහල් - මඩකලපුවේ කාරෛතිවු
(3) පෙරියානෛකුට්ටි සුවාමිහල් - කොළඹ මෝදර
(4) නාවනාද සිත්තර් - කුයින්ස්බෙරි තේ වත්ත
(5) සෙල්ලප්පා සුවාමිහල් - කොළොංතොට

10. (1) වාච්චියමරායන් - කුත්තු ශිල්පියා (2) ලී කෙළි - පාර්වතී දේවිය
(3) පණ්ණිසෛ - පංච සම්ප්‍රදාය (4) කොම්බුමුරි - වසන්තන් කුත්තු
(5) අම්මන් කරහම් - සහල්

[ දෙවැනි පිටුව බලන්න.

Department of Examinations, Sri Lanka

- අංක 11 සිට 15 තෙක් එක් එක් ප්‍රශ්නයේ 'අ' තීරුව සහ 'ආ' තීරුව යටතේ කරුණු කිහිපයක් දී ඇත. 'ආ' තීරුවේ ඒවා 'අ' තීරුවට අනුව ගළපා ඇති වරණය තෝරන්න.

11.

| 'අ' | 'ආ' |
|---|---|
| (i) කච්චියප්ප මුනිවර් | A - ඥානසම්බන්දන් මාසික සඟරාව |
| (ii) දරුමපුර ආදීනම් | B - සිවඥානපාඩියම් |
| (iii) නමසිවාය මූර්තිහල් | C - තිරුවාවඩුතුරෛ ආදීනම් |
| (iv) සිරුංගේරි මඩම | D - ආදිශංකරර් |
| (v) සිවඥාන මුනිවර් | E - තණිගෛපුරාණම් |

(1) BDCAE (2) CDBEA (3) EACBD (4) EACDB (5) EDABC

12.

| 'අ' | 'ආ' |
|---|---|
| (i) සාංඛියම් | A - කෞදමර් |
| (ii) යෝගම් | B - පාදරායණර් |
| (iii) නියායම් | C - කබිලර් |
| (iv) වෛශේඩිගම් | D - පදංජලි |
| (v) වේදාන්තය | E - ගණාදර් |

(1) BDEAC (2) BEACD (3) CDAEB (4) DBACE (5) EABDC

13.

| 'අ' | 'ආ' |
|---|---|
| (i) කොඩියේට්‍රම් | A - ආරක්ෂා කිරීම |
| (ii) වාහන තිරුවිලා | B - වසා තැබීම |
| (iii) තේරු උත්සවය | C - විනාශ කිරීම |
| (iv) මෞනෝට්සවම් | D - ආශිර්වාද කිරීම |
| (v) දිය කැපීම | E - මැවීම |

(1) ADECB (2) CDBEA (3) EACBD (4) EBACD (5) EDABC

14.

| 'අ' | 'ආ' |
|---|---|
| (i) මුහුණ | A - සූර්යරුබම් |
| (ii) ඇස | B - බ්‍රහ්මරූබම් |
| (iii) දකුණු පස | C - විෂ්ණු |
| (iv) වම් පස | D - ශිවරූබම් |
| (v) නාභිය | E - ශක්තිරූබම් |

(1) ADCEB (2) BCDAE (3) CDAEB (4) CDBEA (5) EDCAB

15.

| 'අ' | 'ආ' |
|---|---|
| (i) ඉයමම් | A - ස්වසනය පුහුණු කිරීමේ පුහුණුව |
| (ii) නියමම් | B - පංච ඉන්ද්‍රියන්ගේ පාලනය |
| (iii) ආසනම් | C - වාඩිවීම හා ශරීරය භාවනා මාර්ගයට සූදානම් කිරීම |
| (iv) ප්‍රණායාමම් | D - වැරදි ක්‍රියා වැලැක්වීම |
| (v) පිරත්තියාගාරම් | E - විනය මාලා පිළිපැදීම |

(1) ADCEB (2) EBACD (3) EDABC (4) EDCAB (5) DECAB

- අංක 16 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නයට අදාළ ව දී ඇති පිළිතුරු අතුරෙන් වඩාත් සුදුසු පිළිතුර තෝරන්න.

16. 'කෝයිල්' යනුවෙන් හැඳින්වෙන දේවාලය
(1) තිරිපුවනේෂ්වරම් (2) සිදම්බරම් (3) තංජෛ මහ දේවාලය
(4) අයිරාවදේෂ්වරම් (5) ගංගෛ කොණ්ඩ සෝලේෂ්වරම්

17. හින්දු දාර්ශනික මිනුම්වලට අයත් **නොවන්නේ,**
(1) පිරත්තියට්සම් (2) අනුමානම් (3) පදාර්ථම්
(4) ආප්තවාක්කියම් (5) උවමානම්

18. භගවත් ගීතාව විස්තර කරන යෝග අතරට ඇතුළත් **නොවන්නේ,**
(1) කුණ්ඩලිනි යෝගය (2) අර්ජුනවිශාද යෝගය (3) රාජ යෝගය
(4) කර්ම යෝගය (5) විභූති යෝගය

[ තුන්වැනි පිටුව බලන්න.

Department of Examinations, Sri Lanka

19. ශෛව සිද්ධාන්තයේ සඳහන් වන ආණවම් හි ගතිලක්ෂණ ඇතුළත් කාණ්ඩය,
(1) කොලෛ, මදම්, ඉරුත්තල්, කට්පම්
(2) විගට්පම්, කට්පම්, කුරෝදම්, මෝගම්
(3) නගෛ, අඥර්, විඩුදල්, කිඩත්තල්
(4) කට්පම්, කුරෝදම්, ඉයට්ට්‍රල්, මෙවල්
(5) කුරෝදම්, කොලෛ, නගෛ, විඩුදල්

20. පංචාංගයේ අංග පහ
(1) සතිය, නට්සත්තිරම්, කරණම්, අත්තම්, තිදි
(2) තිදි, යෝගම්, රෝහිණී, නට්සත්තිරම්, කරණම්
(3) නට්සත්තිරම්, කරණම්, මිරුගසීරුඩම්, තිදි, යෝගම්
(4) සතිය, තිදි, නට්සත්තිරම්, යෝගම්, කරණම්
(5) යෝගම්, සතිය, රෝහිණී, අත්තම්, තිදි

21. අරුණගිරිනාදර්ගේ ගීතිකා ඇතුළත් කාණ්ඩය,
(1) කන්දරලංගාරම්, මයිල්විරුත්තම්, තිරුවිරුත්තම්, තිරුප්පුහල්
(2) තිරුප්පුහල්, කන්දරලංගාරම්, කන්දරනුපූදි, වේල්විරුත්තම්
(3) කන්දරනුපූදි, කන්දර්කලිවෙණ්පා, සේවල්විරුත්තම්, වේල්විරුත්තම්
(4) කන්දරන්දාදි, තිරුමොලි, කන්දරලංගාරම්, තිරුප්පුහල්
(5) කන්දරලංගාරම්, තිරුවිරුත්තම්, වේල්විරුත්තම්, සේවල්විරුත්තම්

22. රාමානුජර්ගේ වේදාන්ත මතය පිළිබඳ නිවැරදි ප්‍රකාශය,
(1) මෙය තත්තුව තිරය මතය යනුවෙන් ද හඳුන්වනු ලබයි.
(2) ආත්ම නිදහසට වායුභගවාන් අවශ්‍ය බව සඳහන් කරයි.
(3) පිරසින්න බෞද්ධ යනුවෙන් ද හඳුන්වනු ලබයි.
(4) න්‍යාය තහවුරු කිරීමට ප්‍රමාණ වර්ග හය පිළිගනී.
(5) 'සත්‍ය දේ ඊශ්වර දෙවියන් පමණි' යයි පවසයි.

23. තංජෛ මහ දේවාලයේ චිත්‍ර පමණක් ඇතුළත් කාණ්ඩය,
(1) යෝගදක්ෂිණාමූර්ති, තිරුකෛලාස දසුන, තිරිපුරාන්දගර්, සෝමාස්කන්දර්
(2) රාජරාජන් හා කරුවූර් දේවර්, බාධා කර ආශිර්වාද කළ ඉතිහාස කතාව, සෝමාස්කන්දර්, තිරිපුරාන්දගර්
(3) යෝගදක්ෂිණාමූර්ති, බාධා කර ආශිර්වාද කළ ඉතිහාස කතාව, තිරිපුරාන්දගර්, තිරුකෛලාය දසුන
(4) තිරුකෛලාය දසුනු, තිරිපුරාන්දගර්, සෝමාස්කන්දර්, දක්ෂිණාමූර්ති
(5) රාජරාජන් හා කරුවූර් දේවර්, යෝගදක්ෂිණාමූර්ති, බෛරවර්, බාධා කර ආශිර්වාද කළ ඉතිහාස කතාව

24. ධර්මශාස්ත්‍ර පැහැදිලි කරන පංචයක්ඥ මොනවා ද?
(1) බ්‍රමයක්ඥ, ක්‍රිෂ්ණයක්ඥ, පිදිර්යක්ඥ, භූතයක්ඥ, මනුෂ්‍යයක්ඥ
(2) දේවයක්ඥ, සූර්යයක්ඥ, භූතයක්ඥ, මනුෂ්‍යයක්ඥ, පිදිර්යක්ඥ
(3) පිදිර්යක්ඥ, බ්‍රමයක්ඥ, ඍෂියක්ඥ, භූතයක්ඥ, දේවයක්ඥ
(4) මනුෂ්‍යයක්ඥ, පිදිර්යක්ඥ, දේවයක්ඥ, සූර්යයක්ඥ, බ්‍රමයක්ඥ
(5) බ්‍රමයක්ඥ, දේවයක්ඥ, පිදිර්යක්ඥ, භූතයක්ඥ, මනුෂ්‍යයක්ඥ

25. පස්වාර්ෂික ශිවරාත්‍රි මොනවා ද?
(1) මාසික ශිවරාත්‍රි, වාර්ෂික ශිවරාත්‍රි, පට්ස ශිවරාත්‍රි, යෝග ශිවරාත්‍රි, නිත්‍ය ශිවරාත්‍රි
(2) පට්ස ශිවරාත්‍රි, තිදි ශිවරාත්‍රි, වාර්ෂික ශිවරාත්‍රි, මාසික ශිවරාත්‍රි, යෝග ශිවරාත්‍රි
(3) යෝග ශිවරාත්‍රි, ඥාන ශිවරාත්‍රි, පට්ස ශිවරාත්‍රි, වාර්ෂික ශිවරාත්‍රි, මාසික ශිවරාත්‍රි
(4) නිත්‍ය ශිවරාත්‍රි, මාසික ශිවරාත්‍රි, මහා ශිවරාත්‍රි, පට්ස ශිවරාත්‍රි, යෝග ශිවරාත්‍රි
(5) මාසික ශිවරාත්‍රි, ඥාන ශිවරාත්‍රි, නිත්‍ය ශිවරාත්‍රි, මහා ශිවරාත්‍රි, පට්ස ශිවරාත්‍රි

26. 'කන්මම්' හි ක්‍රියා මොනවා ද?
(1) අඥර්, ඉරුත්තල්, කිඩත්තල්, පරනින්දෛ සහ මෙවල්
(2) ඉරුත්තල්, කිඩත්තල්, විඩුදල්, ඉයැට්ට්‍රල් සහ මෝගම්
(3) ඉයැට්ට්‍රල්, විඩුදල්, මෝගම්, කට්පම් සහ ඉරුත්තල්
(4) පරනින්දෛ, ඉයැට්ට්‍රල්, විගට්පම්, ක්‍රෝදම් සහ මෝහම්
(5) විඩුදල්, ඉයැට්ට්‍රල්, පරනින්දෛ, මෙවල් සහ නගෛ

27. ඥාන මාර්ගයේ සඳහන් වන දසකාර්යවලට අයත් ඒවා පමණක් ඇතුළත් කාණ්ඩය කුමක් ද?
(1) ආත්ම වන්දනාව, ආත්මසුත්ති, තත්තුවරූබම් සහ ශිවරූබම්
(2) ආත්ම ලාභය, තත්තුව වන්දනාව, ශිවපෝගම් සහ තත්තුවසුත්ති
(3) ආත්ම වන්දනාව, ආත්ම ඥානය, ශිව ඥානය, සහ ශිව වන්දනාව
(4) තත්තුවරූබම්, තත්තුවතිරයම්, ශිවයෝගම් සහ ශිවරූබම්
(5) ආත්මසුත්ති, ආත්මසුලුත්ති, ශිව ඥානම් සහ ශිව වන්දනාව



Department of Examinations, Sri Lanka
Department of Examinations, Sri Lanka

28. දෙවියන්ට ළඟා වීමේ මාර්ගවලින් කර්ම යෝගය යනු ආත්මාර්ථකාමිත්වය පිළිබඳව නොසිතන,
(1) යෝග මාර්ගයයි. (2) ප්‍රේම මාර්ගයයි.
(3) දැනුමේ මාර්ගයයි. (4) ඉපයීමේ මාර්ගයයි.
(5) භාවනා මාර්ගයයි.

29. තෛපොංගල් උත්සවය මගින් වර්ධනය කරනු ලබන යහපත් ගතිලක්ෂණවලින් කිහිපයක් වන්නේ,
(1) ආදරය, පුණ්‍යක්‍රියා, අහිංසාව, කළගුණ අමතක නොකිරීම සහ බෙදාහදාගෙන කෑම ය.
(2) දෙවි වන්දනාව, වැඩිහිටියන්ට ගරු කිරීම, සුබ පැතීම සහ සමාව දීම ය.
(3) ආදරය, අහිංසාව, බෙදාහදාගෙන කෑම, කෑම දීම සහ සුබ පැතීම ය.
(4) අහිංසාව, ආදරය, දෝෂාරෝපණය කිරීම, පුණ්‍ය ක්‍රියා සහ කෑම දීම ය.
(5) ආදරය, පුණ්‍යක්‍රියා, ඊර්ෂ්‍යාව, අහිංසාව සහ දෙවි වන්දනාව ය.

30. හින්දු වෛද්‍ය ක්‍රමයේ වැදගත්කම,
(1) පාරිසරික වෛද්‍ය ක්‍රමයක් වීම ය.
(2) ඉංග්‍රීසි බෙහෙත්වල මෙන් ම මෙම ක්‍රමයෙහි බෙහෙත්වලින් ද අතුරු ආබාධ ඇති වේ.
(3) පෙරදිග වෛද්‍ය ක්‍රමය හා කිසිම සම්බන්ධයක් නැත.
(4) අකුපංචර් වෛද්‍ය ක්‍රමයෙන් මුළුමනින් ම වෙනස් ය.
(5) ඉංග්‍රීසි වෛද්‍ය ක්‍රමවලින් සුව කළ නොහැකි සමහර ලෙඩ රෝග ද මෙම ක්‍රමයෙන් සුව කළ හැකි ය.

● අංක **31** සිට **35** තෙක් එක් එක් ප්‍රශ්නයට අදාළ ව කිසියම් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් දී ඇත. ඒවායින් දී ඇති මාතෘකාවට **නොගැළපෙන** ප්‍රකාශය තෝරන්න.

31. **අදර්ව වේදය**
(1) තිරයීවිද්‍යා යන වචන භාවිතයට ඇතුළත් නොකරන ලද වේදයයි.
(2) කෝබද පිරාමණම් මෙම වේදයට අයත් ය.
(3) මෙම වේදයේ අඩංගු වන පිළියම් ක්‍රම්වේද පිරහාර ලක්ෂණ විදි පඩලම් හි සඳහන් වී ඇත.
(4) මෙය කාණ්ඩ 20කින් හා සූක්ත 731කින් යුක්ත ය.
(5) මෙහි පෞෂ්ටියාණි මන්ත්‍ර ආර්ථික සමෘද්ධිය පදනම් කර ගනිමින් පිහිටා ඇත.

32. **උමාපති සිවාචාරියාර්**
(1) සංස්කෘත භාෂාවෙන් පෞෂ්කර ආගමම්වලට විවරණයක් ලියූ කෙනෙකි.
(2) මෙයිකණ්ඩ දේවර්ගේ ම ශිෂ්‍යන්ගෙන් කෙනෙකි.
(3) සිදම්බරම් හි කොඩිකවි ගයමින් කොඩිය එසවීමට ක්‍රියා කළ අයෙකි.
(4) සිදම්බරම් හි තිල්ලෙවාල් අන්දනාර් පරම්පරාවේ උපත ලැබූ කෙනෙකි.
(5) ඇදූරුතුමාට දෙවි කෙනෙකු සේ ගෞරව කරන, පරිණතභාවය ලොවට පෙන්වා දුන් කෙනෙකි.

33. **පොළොන්නරුවේ අංක එක ශිව දේවාලය**
(1) මෙය 61' 9" දිගින් යුක්ත ය.
(2) දකුණු ඉන්දීය කැටයම් නිර්මාණ ක්‍රමයට අනුව ඉදි කරවන ලද්දකි.
(3) මෙය මුළුමනින් ම කළුගලින් නිර්මාණය වූ දේවාලයකි.
(4) ද්‍රවිඩ වාස්තු විද්‍යා සම්ප්‍රදායට අයත් ය.
(5) වේසර වාස්තු විද්‍යා සම්ප්‍රදායට අයත් ය.

34. **පෙරියානෙක්කුට්ටි සුවාමිහල්**
(1) සිත්තානෙක්කුට්ටි සුවාමිහල්ගේ ප්‍රධාන ගෝලයා ය.
(2) 19 වන සියවසේ ඉන්දියාවේ තමිල්නාඩුවේ උපත ලැබුවෙකි.
(3) සර්. පොන්. අරුණාසලම් සමග සබඳතා ඇති කර ගත් අයෙකි.
(4) අනුන්ගෙන් කප්පම් මුදල් ලබාගෙන ඔවුන්ට හිරිහැර කළ තැනැත්තා යහමඟට හැරවූ අයකි.
(5) පූජ්‍ය පක්ෂයේ දුම්රිය ගාස්තු අය කිරීම නැවැත්වූ අයෙකි.

35. **වඩමෝඩි කුත්තු සඳහා වන අලංකාර කිරීම්**
(1) මුළු ශරීරයට ම සුදු පැහැති වත්සුණු ගා ගෙන සිටී.
(2) පාදවල කිංකිණි පැලඳ, අතේ කුමක් හෝ ආවුදයක් තබා ගෙන සිටී.
(3) කොඩුක්කු ඇඳුමෙන් සැරසී සිටී.
(4) පිරිමින්ට රජ කිරුළ පළඳයි.
(5) රඟපාන චරිතයට අනුව අලංකරණය කෙරේ.



Department of Examinations, Sri Lanka

- පහත A සිට J දක්වා දී ඇති වචන අතුරෙන් දෙකක් විශේෂ කරුණක් මත එකිනෙක අතර සම්බන්ධතාවක් දක්වයි. එම සම්බන්ධතාව පදනම් කරගෙන, අංක **36** සිට **40** තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර ඇතුළත් වරණය තෝරන්න.

| | | | | |
|---|---|---|---|---|
| A<br>සත්කාරිය ප්‍රතිපත්තිය | B<br>මීමාංසා සූත්‍රය | C<br>උබනයම් | D<br>විවර්තවාදය | E<br>ඖෂධී සූක්තය |
| F<br>පිරාමණම් | G<br>අවච්චේදම් | H<br>සල්ලිය කිරියෛ | I<br>සදසත්තු | J<br>තන්දිරම් |

36. වෛදික පිළිවෙත් හා සම්බන්ධ යුගලය
(1) B F (2) C F (3) C I (4) E F (5) H J

37. හින්දු දාර්ශනික ක්ෂේත්‍රයේ ආත්ම මතය හා සම්බන්ධ යුගලය
(1) A H (2) A I (3) D G (4) D I (5) G I

38. හින්දු වෛද්‍ය විද්‍යාව හා සම්බන්ධ යුගලය
(1) A E (2) C H (3) D G (4) E H (5) E J

39. මිනුම් හා සම්බන්ධ යුගලය
(1) A J (2) B E (3) C J (4) F J (5) G J

40. හින්දු දාර්ශනික මූලධර්මවල ප්‍රපංච පිළිබඳ විද්‍යාව හා සම්බන්ධ යුගලය
(1) A D (2) A G (3) D G (4) E G (5) G I

- හින්දු ආගමික ගෘහ නිර්මාණ ශිල්පය හා ආදි සංකරර් පිළිබඳ කරුණු කිහිපයක් පහත දී ඇත. ඒවා ඇසුරෙන්, අංක **41** සිට **45** තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර ඇතුළත් වරණය තෝරන්න.

**ගුප්ත යුගයේ දේවාල වාස්තු විද්‍යාව**

A - කළුගල් තට්ටුවලින් නිර්මාණය වූ සාංචියේ 17වන දේවාලය පෙනුමෙන් ලෙන් දේවාලයකට සමාන ය. නමුත් මෙය ගොඩනඟන ලද දේවාලයකි.

B - ගුප්ත වාස්තු විද්‍යා ඉතිහාසයේ ක්‍රි.ව. 6වන සියවසේ දී ශිඛර සහිත දේවාල නිර්මාණය කිරීම ආරම්භ විය.

C - හතරැස් කුටිය සහ ශිඛර නොමැති පැතලි වහල ක්‍රමය සහිතව උදයගිරි ලෙන් දේවාලය නිම කර තිබේ.

D - ගුප්ත යුගයේ වාස්තු විද්‍යා ඉතිහාසයේ මුල් ඒවා ලෙස හඳුන්වනු ලබන්නේ පිහිටි ගල් හාරා නිම කළ දේවාල ය. මේවා ලෙන් දේවාල ලෙස ද හැඳින්වේ.

E - ගුප්ත යුගයේ ඉදි කළ දේවාල ගඩොල් සහ කළුගල්වලින් නිර්මාණය කර ඇත. මේවා ලෙන් දේවාලවලින් දියුණු වූ ඒවා ය.

F - තියෝගර් දසාවතාර දේවාලයේ පිවිසුම් දොරටුව දෙපස බිත්තිවල ගංගා හා යමුනා කැටයම් නෙළා ඇත. පට්ටාරි මහාදේවන් දේවාලය මෙන් ම මෙය ද ශිඛර සහිත ව නිමවූ දේවාලයකි.

41. ගුප්ත යුගයේ වාස්තු විද්‍යා ශිල්ප ඉතිහාසයේ මුල් අවස්ථාව පිළිබඳ තොරතුරු හා සම්බන්ධ යුගලය,
(1) B E (2) B F (3) D E (4) D F (5) E F

42. ගුප්ත යුගයේ ඉදි කළ දේවාල පිළිබඳ විස්තර හා සම්බන්ධ යුගලය,
(1) A C (2) A D (3) A E (4) C E (5) E F

43. පට්ටාරි මහාදේවන් දේවාලය පිළිබඳ තොරතුරු හා සම්බන්ධ යුගලය,
(1) A F (2) B F (3) C D (4) C E (5) D E

**ආදිශංකරර්**

A - ආදිශංකරර් 'ශන්මදප්‍රදිස්ථාබකර්' යනුවෙන් ප්‍රශංසා කරනු ලබයි.

B - බ්‍රහ්ම සූත්‍රය හා මාණ්ඩූක්‍යකාරිගෙෙ මොහුගේ අද්වෛද මතයට පදනම විය.

C - මොහු ඒකාත්මවාදයට අදාළ පදනම උපනිෂද් මහා වාක්‍ය තුළින් ලබා ගත්තේ ය.

D - සුබ්‍රමණිය පුජංගම්, කනගදාරා ස්තෝත්‍රම් යන ග්‍රන්ථ මොහු විසින් රචනා කරනු ලැබී ය.

44. ආදිශංකරර් දාර්ශනිකයකු ලෙස හඳුන්වා දෙන ප්‍රකාශ ඇතුළත් යුගලය,
(1) A C (2) A D (3) B C (4) B D (5) C D

45. ආදිශංකරර්ගේ ආගමික සේවා පැහැදිලි කරන ප්‍රකාශ ඇතුළත් යුගලය
(1) A B (2) A C (3) A D (4) B C (5) B D



Department of Examinations, Sri Lanka
Department of Examinations, Sri Lanka

● ප්‍රශ්න අංක **46** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට අදාළව මාතෘකාවක් යටතේ කරුණු පහක් දී ඇත. ඒවායින් මාතෘකාවට වඩාත් සුදුසු ප්‍රකාශය තෝරන්න.

46. **හින්දු නිම්න ශිෂ්ටාචාරය**

(1) 19 වන සියවසේ සර් ජෝන් මාර්ෂල්ගේ නායකත්වයෙන් යුතු කණ්ඩායමක් විසින් මෙහි පුරා විද්‍යා කැණීම් සිදු කරන ලදී.

(2) හින්දු නිම්නයේ ජනතාව බිලිදීම විශ්වාස නොකළේ ය.

(3) මොහෙන්ජදාරෝ ප්‍රදේශය වර්තමානයේ පවතින්නේ පාකිස්ථානයේ ය.

(4) හින්දු නිම්නය යන වචනයේ තේරුම මහා සොහොන් බිම යන්න යි.

(5) හින්දු නිම්නයේ හමුවූ පිළිස්සුණු බෝනික්කන්ගේ රූප විෂ්ණු දේව වන්දනාවේ පැරණිකමට සාක්ෂි දරයි.

47. **හින්දු සාහිත්‍යවල ධර්මය**

(1) සාන්දෝක්‍ය උපනිෂද් හි 'සත්තියම් වද', 'ධර්මම් සර' යන ධර්ම දේශනා ඇතුළත් වේ.

(2) "ධර්මය රැක ගැනීම පිණිස සියලු යුගවල මා උපදිමි" යන ක්‍රිෂ්ණ දෙවියන්ගේ ප්‍රකාශය රාමායණයේ සඳහන් වී ඇත.

(3) විනය, ආදරය, ආශිර්වාදය, ආචාරධර්ම යනුවෙන් දීර්ඝ වන ධර්මානුකූල අදහස් සිවප්‍රකාසම්හි සඳහන් වී ඇත.

(4) "යාවර්ක්කුමාම් ඉරෛවර්ක්කොරු පච්චිලෛ" යන ප්‍රකාශය පෙරියපුරාණම් හි සඳහන් වී ඇත.

(5) 'උසස් ම ධර්මය වන්නේ ආචාරධර්මයි' යනුවෙන් මනුස්මිරුදි පවසයි.

48. **තිරුමූලර් සහ තිරුමන්දිරම්**

(1) ශෛවම් යන වචනය මුල්වරට භාවිතයට ගැනුණේ තිරුමන්දිරම්වල ය.

(2) තිරුමූලර් ධර්මපුර ආදීනම් බිහි කරනු ලැබුවේ ය.

(3) ඔහු නවනාද සිත්තර් සම්ප්‍රදායට අයත් කෙනෙකු ලෙස සැලකේ.

(4) 'කුලය එකකි, දෙවියන් ද එක්කෙනෙකි.' යන ප්‍රකාශය සඳහන් වී ඇත්තේ තිරුමන්දිරම්වල ය.

(5) තිරුමන්දිරම් යනු හින්දු ආගමික සම්ප්‍රදායේ සංස්කෘත භාෂා ආභාසයෙන් තොරව දෙමළ භාෂාව පමණක් යන අරමුණෙන් රචනා කරන ලද ග්‍රන්ථයකි.

49. **සර් පොන්. රාමනාදන්**

(1) ශෛව පරිපාලන සභාවේ අරමුණට අනුව යාපනයේ හින්දු විද්‍යාල ආරම්භ කර පවත්වාගෙන ගියේ ය.

(2) 'හින්දු සාදනම්' යන පුවත්පත පළ කිරීමට මුල් වී කටයුතු කළේ ය.

(3) 'සෙන්තමිල් ඉලක්කනම්' යන ග්‍රන්ථය රචනා කළේ ය.

(4) තිරුකේදීශ්වරම් දේවාල ඉඩම රජයෙන් ලබා ගැනීමට වැඩි දායකත්වයක් ලබා දුන්නේ ය.

(5) හින්දු යෞවන සමාජය පිහිටුවීමට දැඩි මහන්සියක් දැරුවේ ය.

50. **සිවාගමංගල්**

(1) දෙව් රූප නෙළීමට අදාළ කළුගල තේරීම පිළිබඳව 'තාරු පරීක්ෂණම්' යන මාතෘකාවෙන් පැහැදිලි කරයි.

(2) සිවාගමම්වල කිරියාපාදම් 'පවිත්‍රවිදි' පිළිබඳව පැහැදිලි කරයි.

(3) කොඩි එසවීමේ මංගල්‍යයේ දී කහ පැහැති ලණුව ශෛව සිද්ධාන්ත මතයේ ආත්මය පිළිබිඹු කරයි.

(4) සිවාගමම්වල ප්‍රදීමාලට්ෂණවිදි පඩලම්හි අණිමා වැනි අට වාර්ගික 'සිත්තිහල්' පිළිබඳව පැහැදිලි කර ඇත.

(5) කොඩි එසවීමට පෙර සිදු කරනු ලබන පූජා කටයුතුවල දී පේරිතාඩනම් යන්න මැවීමේ ක්‍රියාව පිළිබිඹු කරයි.

* * *

Department of Examinations, Sri Lanka

Department of Examinations, Sri Lanka

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2017 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2017

| | | | |
|---|---|---|---|
| හින්දු ධර්මය II<br>இந்து சமயம் II<br>Hinduism II | 42 S II | | පැය තුනයි<br>மூன்று மணித்தியாலம்<br>Three hours |

**උපදෙස් :**

✻ I කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, II කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

1. "භක්ති මාර්ගය වර්ධනය වීම කෙරෙහි නායන්මාර්ලාගේ හා ආල්වාර්ලාගේ දායකත්වය ඉතා උසස් ය." මෙය ඇසුරින් පහත සඳහන් ඒවා පැහැදිලි කරන්න.
   (අ) කාරයික්කාල් අම්මෙයාර්ගේ භක්තිවන්තභාවය
   (ආ) ශෛව හා වෛෂ්ණව භක්ති මාර්ගයේ දියුණුවට රජවරුන්ගේ දායකත්වය
   (ඉ) නායන්මාර්ලාගේ පනුවල්හි දක්නට ඇති භක්ති මාර්ගයේ විශේෂ ලක්ෂණ
   (ඊ) වෛෂ්ණව භක්ති මාර්ගයේ දියුණුවට ආල්වාර්ලාගේ දායකත්වය

2. "පුරාණම් හින්දු ආගමික කේන්ද්‍රය වේ." මෙම ප්‍රකාශය පහත සඳහන් මාතෘකා ඇසුරෙන් විමසන්න.
   (අ) පුරාණම්වල සඳහන් හින්දු ආගමික මාර්ග
   (ආ) පුරාණංගල් විස්තර කරන හින්දු ආගමික කලා සම්ප්‍රදාය
   (ඉ) පුරාණංගල් පැහැදිලි කරන හින්දු ආගමික සාරධර්ම
   (ඊ) කන්දපුරාණ සංස්කෘතිය

3. "හින්දු ආගමික චින්තනයේ බිහිවීමට ප්‍රධාන මූලාශ්‍රයක් වනුයේ උපනිශද් ය." මෙම ප්‍රකාශයේ අදාළත්වය පහත සඳහන් මාතෘකා ඇසුරෙන් පරීක්ෂා කරන්න.
   (අ) 'උපනිශද්' යන්නෙහි තේරුම
   (ආ) උපනිශද්වල බ්‍රහ්මම් හා ආත්මය
   (ඉ) උපනිශද්වල ප්‍රපංචය
   (ඊ) උපනිශද්වල කන්මම් හා නැවත ඉපදීම

## II කොටස

4. "වේදාන්ත දාර්ශනික වර්ධනයේ මත්තුව වේදාන්තය සුවිශේෂිත ය." මෙම ප්‍රකාශය ඇසුරෙන් පහත සඳහන් ඒවා පැහැදිලි කරන්න.
   (අ) 'තුවෛදම්' යන්නෙහි අර්ථය
   (ආ) මත්තුවර් පෙන්වා දෙන පංච වාර්ගික භේදය
   (ඉ) මත්තුව වේදාන්තයේ විමුක්තිය
   (ඊ) විසිට්ටාත්වෛදම් හා තුවෛදම්

5. "ශෛව සිද්ධාන්තයේ මායෙය අභ්‍යන්තර දෙයකි." යන ශෛව සිද්ධාන්ත මතය පහත සඳහන් මාතෘකා යටතේ පරීක්ෂා කරන්න.
   (අ) 'මායෙය' යන්නෙහි අර්ථය
   (ආ) මායෙයෙහි ගුණාංග
   (ඉ) සුත්ත මායෙය
   (ඊ) පිරකිරුදි මායෙය

6. ශ්‍රී ලංකාවේ හින්දු ආගමික වර්ධනයට සුවාමි විපුලානන්දර් විසින් ඉටු කරන ලද සේවා පිළිබඳව විමසන්න.

7. "අරුම්පෙරල් මරබිල් පෙරුම් පෙයර් මුරුග" යන ප්‍රකාශය ආශ්‍රයෙන් පහත සඳහන් ඒවා පැහැදිලි කරන්න.
   (අ) කෞමාර මාර්ගයේ පැරණි බව
   (ආ) මුරුග දෙවියන්ගේ උපවාසය
   (ඉ) මුරුග දෙවියන්ගේ වන්දනා ක්‍රම
   (ඊ) ආරුපඩෛ වීඩුහල්

8. පහත සඳහන් ඒවායින් **හතරකට** කෙටි සටහන් ලියන්න.
   (අ) පිරකිරුදි
   (ආ) වරාහමිහිරර්
   (ඉ) කන්නගි වන්දනාව
   (ඊ) කුලකෝට්ටන් රජතුමාගේ හින්දු ආගමික සේවා
   (උ) වෛකුණ්ඨ ඒකාදසි උපවාසය
   (ඌ) නගුලේශ්වරම් දේවාලය

* * *